අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/1/1/5/1

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2025.02.12

**චක්‍රලේඛ අංකය: 09 / 2025**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම පරිවෙණාධිපති හිමිවරුන්

සියලු ම විදුහල්පතිවරුන් වෙත

**සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල - 2025**

අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් වාර්ෂිකව පැවැත්වෙන උක්ත උළෙලෙහි 2025 වර්ෂයට නියමිත කොන්දේසි, උපදෙස් සහ නිර්මාණ ඉදිරිපත් කළ යුතු ශීර්ෂ පිළිබඳ තොරතුරු මේ සමග ඇත. මේ පිළිබඳව අදාළ ගුරුභවතුන් සහ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් දැනුවත් කර මෙම තරගයට ඔවුන්ගේ නිර්මාණ ඉදිරිපත් කරවීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වමි.

මෙය පහත ආකාරයෙන් සමන්විත ය.

- පිටු අංක 03 සිට 18 දක්වා සිංහල මාධ්‍ය අංශය පිළිබඳ තොරතුරු
- පිටු අංක 19 සිට 32 දක්වා දෙමළ මාධ්‍ය අංශය පිළිබඳ තොරතුරු

මේ සඳහා ඉදිරිපත් වන සියලු ම තරගකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් තරගයේ සෑම අවස්ථාවකම මෙම චක්‍රලේඛයේ සඳහන් සියලු කොන්දේසි පිළිපැදීමට එකඟ විය යුතු ය.

නාලක කළුවැව

ලේකම්

# සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උලෙළ 2025 (සිංහල මාධ්‍ය)

## හැඳින්වීම

දිවයිනේ පාසල්වල සිසුන්ගේ නාට්‍ය රසවින්දන ශක්තීන් දියුණු කිරීමත්, සිසුන් සහ ගුරුවරුන් නිර්මාණකරණයට යොමු කිරීම මගින් නාට්‍ය හා රංග කලා විෂය පිළිබඳ ප්‍රායෝගික සහ විෂයානුබද්ධ අත්දැකීම් රාශියක් ඔවුනට ලබාදීමත් උදෙසා මෙම උලෙළ සංවිධානය කෙරේ. පාසල්වල දැනට ක්‍රියාත්මක වන විෂයමාලාවෙහි නාට්‍ය හා රංගකලා විෂය 6වන ශ්‍රේණියේ සිට 13වන ශ්‍රේණිය දක්වා ඇතුළත්ව ඇති බැවින් මෙම උලෙළ සංවිධානය කිරීමෙන් එම විෂය සංවර්ධනය සඳහා සුවිශේෂී දායකත්වයක් ලැබෙනු ඇත. සිසුන් තුළ යහපත් ආකල්ප පෝෂණය කරමින් ජාතියේ සංවර්ධනය අරමුණු කර ගෙන දරු දැරියන්ගේ පෞරුෂය සංවර්ධනය කිරීම උදෙසා ද මෙම උලෙළ දායක වේ. මෙයින් ජාතික මට්ටමින් ඇගැයීමට ලක් කෙරෙන සිසුන් උසස් අධ්‍යාපනයට යොමු වීමේ දී ද ප්‍රමුඛතාවට පත් වේ.

## උලෙළ පිළිබඳ පොදු නීති රීති

## 1. උලෙළෙහි කාණ්ඩ

- 1 කාණ්ඩය - කෙටි නාට්‍ය නිෂ්පාදන (කෙටි නාට්‍ය, ළමා ප්‍රේක්ෂාගාරයක් සඳහා නාට්‍ය සහ ඒකල භාෂණ නාට්‍ය).
- 2 කාණ්ඩය - නිර්දේශිත නාට්‍ය ජවනිකා (යෝජිත විදේශීය නාට්‍යකරුවන්ගේ නාට්‍ය, ශේක්ෂ්පියර් නාට්‍ය සහ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය ආශ්‍රිත නාට්‍ය ජවනිකා ප්‍රතිනිර්මාණය).
- 3 කාණ්ඩය - ඒකල නිරූපණ (නිර්දේශ කරන සංවාද ඛණ්ඩයක් නාට්‍යානුසාරී ඉදිරිපත් කිරීම, ගැමි නාටක චරිත නිරූපණ, කතාන්දර කථනය සහ අභිරූපණ).

## 2. උලෙළෙහි අවස්ථා

පිටපත් ඇගැයීම, පළාත් ඇගැයීම සහ අවසාන ඇගැයීම (ජාතික වටය) වශයෙන් අවස්ථා තුනක් ඔස්සේ මෙය පැවැත්වේ.

## 3. උලෙළෙහි ජාතික වටයේ නාට්‍ය වේදිකාගත කිරීම.

මෙය එක අදියරකින් හෝ අදියර දෙකකින් පැවැත්වෙනු ඇත.

## 4. සහභාගීත්වය

4.1 රජයේ පාසල්වල සිසුන්ට සහ ගුරු භවතුන්ට, පිරිවෙන්වල ඉගෙනුම ලබන සිසුන්ට හා පිරිවෙන් ගුරු සේවයේ ගුරු භවතුන්ට සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමත පෞද්ගලික පාසල්වල සිසුන්ට සහ ගුරු භවතුන්ට මෙම උලෙළට සහභාගී විය හැකි ය. එමෙන්ම සීමිත ශීර්ෂ සංඛ්‍යාවක් සඳහා ජාත්‍යන්තර පාසල් සහ වෙනත් එවැනි පෞද්ගලික පාසල්වල සිසුන්ට ද සහභාගී විය හැකි ය. (රජයේ පාසල්වල සේවය කරන සංවර්ධන නිලධාරීන්ට ද මෙම උලෙළට සහභාගී විය හැකි අතර, මෙම උලෙළෙහි දී ඔවුන් අත් කරගන්නා යම් ජයග්‍රහණයක් හෝ ඇගැයීමක්, ශ්‍රී ලංකා ගුරු සේවයට ඇතුළත් වීම සඳහා සුදුසුකමක් ලෙස නොසැලකේ).

4.2 නාට්‍ය හා රංග කලාව විෂය ඉගැන්වෙන පාසල්වල සිසුන් හා ගුරු භවතුන් මෙම උලෙළට අනිවාර්යයෙන්ම සහභාගී වීම අපේක්ෂා කෙරේ.

4.3 මෙම උලෙළට ඒ ඒ ශීර්ෂ යටතේ නියම කර ඇති ශ්‍රේණිවල සිසු-සිසුවියන්ට සහභාගී විය හැකි ය. එමෙන්ම 2025 වර්ෂය සඳහා පැවැත්වීමට නියමිත අ.පො.ස උසස් පෙළ විභාගයේ දී එම

පාසල මගින් දෙවන වර උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින සිසු-සිසුවියන්ට ද එම විභාගයට පූර්වයෙන් සහභාගී විය හැකි ය.

4.4 මීට පෙර සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා තරගයන්ට හා සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙළවලට ඉදිරිපත්ව ජයග්‍රහණ ලබාගත් පිටපත් හෝ නිර්මාණ මෙම උළෙළ සඳහා නැවත නිෂ්පාදනය කළ නොහැකි ය.

4.5 2023 සහ 2024 යන වර්ෂ දෙකෙහි දී ම මෙම උළෙළ සඳහා අඛණ්ඩව එක ම ශීර්ෂය යටතේ සමස්ත ලංකා මට්ටමේ ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන අතරින් කවර හෝ ස්ථානයන් ලබා ගත් පාසලකට මෙම වර්ෂයේ දී එම ශීර්ෂයෙන් ම හෝ ශීර්ෂවලින් ම ඉදිරිපත් විය නොහැකි ය.

4.6 ඉහත 4.5 වගන්තියේ සීමාවන්ට යටත්ව, මෙම චක්‍රලේඛයෙහි 2 කාණ්ඩයේ නාට්‍ය ශීර්ෂයන්ට අයත් වන නාට්‍යයන්ගෙන් කවර හෝ නාට්‍යයක කොටසක් මීට පෙර සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙළෙහි පළාත් හෝ ජාතික වටයන්ට ඉදිරිපත් කළ ඕනෑම පාසලකට, තමන් එසේ ඉදිරිපත් කළ නාට්‍ය කොටස ම නැවත ඉදිරිපත් කළ නොහැකි ය. එම නාට්‍යයේ ම වෙනත් කොටසකින් මේ සඳහා සහභාගී වීමට බාධාවක් නැත.

4.7 වෙනත් පාසලක ගුරුවරයකු හෝ ශිෂ්‍යයෙකු නොවන බාහිර ශිල්පීන් කිසිදු විටෙක ආනුෂංගික ශිල්පීය අවශ්‍යතාවන් සඳහා සහභාගි කරවා නොගත යුතු අතර වෙනත් පාසලක ගුරු භවතෙක් ආනුෂංගික ශිල්පීය අවශ්‍යතාවන් සඳහා සහභාගී කර ගත යුත්තේ ද ඉදිරිපත් වන පාසල අයත් කලාපය තුළින් පමණි.

4.8 තම පාසල මෙම උළෙළට සහභාගී කරවීම සහ සිසු දරු දැරියන්ට අවශ්‍ය සියලු සහයෝගයන් ලබා දීම විෂය භාර ගුරුවරුන්ගේ ද, විදුහල්පතිවරුන්ගේ ද වගකීම වන අතර මෙම උපදෙස් සංග්‍රහයේ සහ චක්‍රලේඛයේ සීමාවන් යටතේ පාසලට අභිමත ශීර්ෂ සංයෝජනයකට අනුව උළෙළට සම්බන්ධ වීමට තම පළාතේ හා අධ්‍යාපන කලාපයේ පාසල් දිරි ගැන්වීම අදාළ පළාතේ හෝ අධ්‍යාපන කලාපයේ සෞන්දර්ය විෂය භාර නිලධාරීන්ගේ වගකීම වේ.

## 5. අයදුම් කිරීම

5.1 1 කාණ්ඩයට ඉදිරිපත් වන පාසල්වලට (උපරිම ශීර්ෂ දෙකකි) 2 කාණ්ඩය සඳහා ඉදිරිපත් විය නොහැකි අතර 3 කාණ්ඩයේ ශීර්ෂයන් අතරින් උපරිම ශීර්ෂ දෙකකට ඉදිරිපත් විය හැකි ය.

5.2 2 කාණ්ඩයට ඉදිරිපත් වන පාසල්වලට (උපරිම ශීර්ෂ දෙකකි) 1 කාණ්ඩය සඳහා ඉදිරිපත් විය නොහැකි අතර 3 කාණ්ඩයේ ශීර්ෂයන් අතරින් උපරිම ශීර්ෂ දෙකකට ඉදිරිපත් විය හැකි ය.

5.3 1 කාණ්ඩයේ 1.3.1 ශීර්ෂයට හෝ 3 කාණ්ඩයට අයදුම් කළ හැක්කේ 1 කාණ්ඩයේ නාට්‍ය නිෂ්පාදනයක් සඳහා අයදුම් කරන පාසල්වලට පමණි (ශිෂ්‍ය සංඛ්‍යාව 300 හෝ ඊට අඩු පාසල්වලට ඉහත සීමාව අදාළ නො වේ).

5.4 ජාත්‍යන්තර පාසල් සහ වෙනත් එවැනි පෞද්ගලික පාසල් සඳහා හඳුන්වා දෙන 1.3.2 සහ 2.2.3 ශීර්ෂවලට, අදාළ පාසලකට එම අංශ දෙකටම හෝ එකකට ඉදිරිපත් විය හැකි ය.

5.5 මෙහි 2 කාණ්ඩයට අයත් වන යම් නාට්‍ය ජවනිකාවක් ඉදිරිපත් කරන යම් පාසලක් 3 කාණ්ඩයේ ඒකල නිරූපණ පිළිබඳ අංශයෙහි නාට්‍යයක භාෂණ කොටසක් තෝරා ගැනීම ආශ්‍රිත ශීර්ෂයකට ඉදිරිපත් වන විට, ඒ සඳහා 2 කාණ්ඩයේ දී තෝරාගත් නාට්‍යයක භාෂණ කොටසක් වේ නම් එම නාට්‍යය තෝරාගත නොහැකි ය.

5.6 3 කාණ්ඩයේ ඒකල නිරූපණ හා කතා පුවත් ඉදිරිපත් කිරීම පිළිබඳ අංශයෙහි නිර්දේශිත සංවාද කොටස් අයත් නාට්‍ය අතර ඇති යම් නාට්‍යයක් 2023 සහ 2024 වර්ෂවල සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙළවල දී 2 කාණ්ඩය සඳහා නිෂ්පාදනය කර, ජාතික වටයේ ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානයක් යම් පාසලක් විසින් ලබා තිබුණේ නම්, එම පාසල්වලට ද තමන්

2 කාණ්ඩයෙන් ඉදිරිපත් වූ එම නාට්‍යයට අයත් සංවාද කොටස් මෙවර 3 කාණ්ඩයෙහි අදාළ ශීර්ෂයක් සඳහා තෝරා ගත නොහැකි ය.

5.7 අයදුම්පත් එවීම සඳහා චක්‍රලේඛයෙන් සඳහන් කෙරෙන අවසාන දිනයට හෝ ඊට පෙර අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙහි සඳහන් පරිදි ලියාපදිංචි තැපැලෙන් පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ පාසල් නාම ලේඛනය, www.moe.gov.lk දරන අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයීය වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධියට පත් කෙරේ. අවසාන දිනයට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර නොගැනේ.

5.8 1 කාණ්ඩයේ ශීර්ෂයන් සඳහා ඉදිරිපත් කරන නාට්‍ය පිටපත්, A4 කඩදාසිවල සම්මත නාට්‍ය පිටපත් ආකෘතියට අනුව පිටුවේ අවකාශය බෙදා ගනිමින්, පොයින්ට් 12 අක්ෂර ප්‍රමාණයෙන් පරිගණක යතුරු ලියනය කර තිබීම අනිවාර්ය වේ. එසේ නොඑවන පිටපත් ප්‍රතික්ෂේප කෙරේ.

5.9 උලෙළට ලියාපදිංචි වීමේ දී චක්‍රලේඛයේ අවසානයට උපලේඛන ගත කර ඇති A යන ලියාපදිංචි වීමේ ආකෘතිය පමණක් භාවිත කළ යුතු ය.

5.10 ඉල්ලුම් කරන ශීර්ෂ සියල්ල ම ඉහත A ආකෘතියෙහි සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු අතර ඒ ඒ ශීර්ෂ සඳහා වෙන ම ලියාපදිංචි වීමේ අයදුම්පත් නොඑවිය යුතු ය.

5.11 ඉහත සඳහන් සහභාගීත්ව සීමාවන් ඉක්මවා අයදුම්පත් ඉදිරිපත් කිරීම උලෙළෙහි සංවිධාන හා පරිපාලන කටයුතු සඳහා බාධාවක් බැවින් එම සීමාවන් නොතකා සහ සීමාව ඉක්මවා ඉදිරිපත් කෙරෙන අයදුම්පත්වල ශීර්ෂ සටහන් කර ඇති අනුපිළිවෙළ අනුව පළමුවෙන් සඳහන් කළ ශීර්ෂ අංකය හෝ අංක දෙක පමණක් ඇතුළත් කරගනු ලැබේ. ශීර්ෂ සියල්ල සටහන් කර එවිය යුතු තනි අයදුම්පත වෙනුවට කිහිප වරකට අයදුම්පත් එවන්නේ නම් පළමුවෙන් එවූ අයදුම්පත පමණක් ඇතුළත් කර ගැනේ.

5.12 තව ද, එකම දිනයක දී අයදුම්පත් එකට වැඩි සංඛ්‍යාවක් එක් පාසලකින් ලියාපදිංචි කර තිබුනේ නම් හෝ එකම දිනයකින් යුතුව අයදුම්පත් එකට වැඩි සංඛ්‍යාවක් අත්සන් කර තිබුණේ නම්, තැපැල් ලියාපදිංචි අංකයේ අඩු අගය සහිත අයදුම්පත හෝ පළමුව ලියාපදිංචි කළ අයදුම්පත පමණක් ඇතුළත් කර ගැනේ.

5.13 අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී ඉතා පැහැදිලි අකුරින් එය සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.

5.14 ඉහත අයදුම්පත **2025 අප්‍රේල් 10** දිනට පෙර අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි තැපෑලපන් එවිය යුතු ය. මෙහි පිටපතක් තම පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද අනිවාර්යයෙන් ම යැවිය යුතු අතර උලෙළට අයදුම් කළ සේ සලකනු ලබන්නේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි තැපෑලෙන් අයදුම් කළේ නම් පමණි. මෙම උපදෙස්වලට පටහැනිව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

5.15 www.moe.gov.lk දරන වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කෙරෙනු ඇති සබැඳිය ඔස්සේ මෙම උලෙළට අයදුම් කිරීමට සකසා ඇති මාර්ගගත අයදුම්පත ද අනිවාර්යයෙන් ම සම්පූර්ණ කළ යුතු ය.

5.16 අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.gov.lk දරන වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කෙරෙන උලෙළට අදාළ චක්‍රලේඛය නිකුත් වූ විට අදාළ පළාත් සහ කලාප සෞන්දර්ය විෂයභාර නිලධාරීන් එම චක්‍රලේඛයෙහි සඳහන් උපදෙස්වලට අනුකූලව තම පළාතේ/කලාපයේ පාසල්වලට අයදුම් කිරීමට අවශ්‍ය වැඩසටහන් පවත්වා ඔවුන් දිශානුගත කිරීම අපේක්ෂා කෙරේ.

5.17 තම පළාතේ පාසල් මේ සඳහා අයදුම් කිරීමේ ප්‍රගතිය දෛනික පදනමින් පිරික්සා බලා අදාළ නිලධාරීන්ට අවශ්‍ය කටයුතු සිදු කිරීම පහසු වනු පිණිස, පළාත් සෞන්දර්ය විෂය භාර අධ්‍යක්ෂට ද මාර්ගගත ලියාපදිංචි වීමේ තම පළාතට අයත් දත්ත පාදකය (database) කරා ප්‍රවේශය ලබා දේ.

5.18 සහභාගී වන සිසු සිසුවියන්ගේ නම් සහිත සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් වන සහභාගීත්ව අයදුම්පත හෙවත් B ආකෘතිය, අදාළ පළාත් හෝ සමස්ත ලංකා වටයන්ට පූර්වයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයීය වෙබ් අඩවියෙහි පළ කෙරෙන අතර, එය පළාත් සහ අවසන් වටයන්ට සහභාගී වීමේ දී ඉදිරිපත් කළ යුතු ය. එම අවස්ථාවේ දී සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් නොකරන පාසල්වලට අදාළ ඇගැයීම් වටයට ඉදිරිපත් විය නොහැකි ය. මුල් අවස්ථාවේ දී A යන පොදු ලියාපදිංචි වීමේ ආකෘතියෙහි තමන් ඉදිරිපත් වන අංගයට සම්බන්ධ වන පුද්ගල සංඛ්‍යාව සඳහන් කළ යුතු වේ.

5.19 B ආකෘතියෙන් සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමේ දී **නම්වල මුල් අකුරු ඉංග්‍රීසියෙන් ලිවිය යුතු ය.**

5.20 මෙහි අංක 1.1, 1.2, 1.3.1 සහ 1.3.2 දරන ශීර්ෂයන් සඳහා නිෂ්පාදනය කරන නාට්‍යවල ස්වතන්ත්‍ර පිටපත් අදාළ පාසලේ විදුහල්පති විසින්, **2025 අප්‍රේල් 10** දිනට පෙර පිටපත් **තුනකින්** යුතුව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අනිවාර්යයෙන් ම යොමු කළ යුතු ය. ඉන් එක් පිටපතක පෙළ රචකගේ නම, අදාළ විදුහලේ විදුහල්පතිගේ නම, අත්සන හා නිල මුද්‍රාව සටහන් කළ යුතු ය. **අනෙක් පිටපත් දෙකෙහි කිසිදු ස්ථානයක, විදුහලෙහි හෝ පුද්ගලයකුගේ අනන්‍යතාවක් හඳුනාගත හැකි කිසිවක් සටහන් නොවිය යුතු ය.**

5.21 මෙම පිටපත් ද එවිය යුත්තේ, මෙහි අවසානයට ඇති A යන පොදු ආකෘති පත්‍රයෙන් සමන්විත අයදුම් පත්‍රය සමග ම වන අතර විධිමත් අයදුම්පත්‍ර නො එවා, පිටපත පමණක් එවා ඇති අවස්ථාවක දි එම පිටපත් ඇතුළත් කර නොගැනේ. එමෙන්ම පිටපත රහිතව එවන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත් හා පිටපත් එවන ලියුම් කවරවල ඉහළ වම් කෙළවරෙහි **'සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙළ - 2025'** යනුවෙන් සටහන් කළ යුතු ය.

5.22 අයදුම්පත් සහ නාට්‍ය පිටපත් එවිය යුතු ලිපිනය:

අධ්‍යාපන අධ්‍යක්ෂ,
සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

5.23 උළෙළෙහි 1 කාණ්ඩයේ ප්‍රථම වටය වන පිටපත් ඇගැයීම විනිශ්චය වටයක් වන බැවින් දෙන ලද කාල සීමාව තුළ ඉහත ලිපිනයට විධිමත්ව නො එවන නාට්‍ය පිටපත් මොන ම හේතුවක් නිසාවත් ඇගැයීම සඳහා භාර නොගන්නා අතර, අයදුම්පත සමග ම එය ඉවත් කෙරේ.

5.24 නිර්දේශිත නාට්‍ය ජවනිකා අයත් 02 කාණ්ඩයේ ශීර්ෂයන්ට අදාළව, තෝරාගත් නාට්‍ය කොටස පිළිබඳ වචන 100ක පමණ සාරාංශයක් තම ලියාපදිංචි වීමේ අයදුම්පත සමග එවිය යුතු වේ.

5.25 පිටපත් ඇගැයීමට ලක් කළ පසුව, පළාත් වටයට සුදුසුකම් ලද 1 කාණ්ඩයේ නාට්‍ය පිටපත් අයත් පාසල්වල නම් සමග උළෙළට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබා ඇති පාසල් නාම ලේඛනය පිටපත් වටය අවසන් කළ වහාම අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයීය වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කෙරේ.

5.26 මීට පෙර වෙනත් කිසිදු නාට්‍ය උළෙළකට හෝ තරගයකට ඉදිරිපත් නොකළ, අන් අයෙකුගේ නිර්මාණ අනුකරණයක් නොවන නව නිර්මාණ පමණක් මේ සඳහා ඉදිරිපත් කළ යුතු ය. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ වෙනත් ආයතනවල නාට්‍ය උළෙළවලට හෝ තරගවලට මින් පෙර ඉදිරිපත් කළ නාට්‍යවල නව නිෂ්පාදන හෝ නාට්‍යවල පිටපත් සංශෝධනය කර හෝ මේ සඳහා ඉදිරිපත් කළ නොහැකි ය. සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙළ අවසන් වටයට ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් එය වෙනත් නාට්‍ය උළෙළකට හෝ තරගයකට ඉදිරිපත් කිරීමේ බාධාවක් නොමැත.

5.27 ඉහත කොන්දේසිවලට පටහැනිව හෝ ඒවා නොතකා අයදුම්පත් ඉදිරිපත් කිරීම අදාළ විදුහලේ නොසැලිකිලිමත් බවක් සේ සලකන බැවින් එවන් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.28 තම පිටපත හෝ ලියාපදිංචි වීමේ අයදුම්පත නිවැරදි ශීර්ෂයට ඉදිරිපත් කරවීමේ වගකීම අදාළ පාසල සතු ය. වැරදි ශීර්යකට අයදුම් කර ඇති බව අනාවරණය වන, උලෙළෙහි ඕනෑම අදියරක දී, නිෂ්පාදනයෙන් පසුව වුව ද, එය විනිශ්වය සඳහා ඇතුළත් කර නොගැනේ.

## 6. උලෙළ අවස්ථා

6.1 මෙම උලෙළ අවස්ථා 03කින් පමණක් සමන්විත වේ.

- පිටපත් වටය: 1 කාණ්ඩයේ 1.1, 1.2, 1.3.1 සහ 1.3.2 ස්වතන්ත්‍ර නාට්‍ය ශීර්ෂ සඳහා
- පළාත් වටය: 1 කාණ්ඩයේ පිටපත් ඇගැයීමට ලක් කරන 1.1, 1.2, 1.3.1 සහ 1.3.2 ශීර්ෂවල හොඳම පිටපත් 05ට අයත් නිෂ්පාදන සහ 2 හා 3 කාණ්ඩවලට ඉදිරිපත් වන පාසල් නියෝජනයෙන්. (පිටපත් ඇගැයීම් වටය එක් පොදු ඇගැයීම් මණ්ඩලයකින් සිදු කෙරෙන්නක් බැවින් යම් පළාතකින් යම් ශීර්ෂයකින් තෝරා ගන්නා පිටපත් 5ට අතිරේකව ඉහළ ප්‍රමිතියේ පිටපත් ඇති බවට ඇගැයීම් මණ්ඩලය තීරණය කරයි නම් ඔවුන්ගේ නිර්දේශය මත එම නාට්‍ය ද පළාත් වටයට ඇතුළත් කර ගැනේ).
- ජාතික වටය: එක්කෝ පළාත් වටයේ දී ප්‍රථම ස්ථානයට පත් වූ හෝ සෘජුව ම අවසාන වටයට කැඳවන පාසල් සහ 1 කාණ්ඩයේ ඒ ඒ නාට්‍ය ශීර්ෂවල සියලු පළාත් නිර්මාණ නැරඹීමෙන් පසුව ඒවා අතරින් කලාත්මක හා ගුණාත්මක ප්‍රමිතිය අතරින් ඉහළ ම මට්ටමේ (A ශ්‍රේණියේ) පවතින බවට ජූරියේ විශේෂ නිර්දේශය මත එක් ශීර්ෂයකින් තෝරා ගන්නා පාසල් දෙකක නියෝජනයෙන් (එක් එක් ශීර්ෂයක් සඳහා පළාතකින් එක බැගින් නාට්‍ය 09ක් සහ ජූරියේ විශේෂ නිර්දේශිත නාට්‍ය 02ක් වශයෙන් උපරිම නාට්‍ය 11කි) . නැතහොත් එම ප්‍රථම ස්ථානවලට අතිරේකව, සමස්ත නිර්මාණ සංඛ්‍යාව 11 නොඉක්මවන ලෙස A ශ්‍රේණියේ ප්‍රමිති මට්ටමේ පවතින බවට තීරණය කෙරුණු නාට්‍යවල නියෝජනයෙන්. 2 කාණ්ඩයෙන් ද පළාත් ප්‍රථම ස්ථානවලට අතිරේකව, ගුණත්මක ප්‍රමිතියෙන් ඉහළම මට්ටමේ (A ශ්‍රේණියේ) පවතින බවට ඇගැයීම් මණ්ඩලය නිර්දේශ කරන නාට්‍යවල නියෝජනයෙන්.

6.2. සියලු නිර්මාණ පළාත් උලෙළ සඳහා ඉදිරිපත් විය යුතු අතර එයින් ජාතික උලෙළ සඳහා සුදුසුකම් ලබා ගත යුතු වේ (යම් පළාතකින් යම් ශීර්ෂයකට ඉදිරිපත් වන්නේ එක් පාසලක් පමණක් නම් සහ එය පළාත් උලෙළ සඳහා සහභාගී වීම ඉතා දුෂ්කර වන්නේ නම් පමණක් එම පාසල සෘජුවම ජාතික වටයට සහභාගී කර ගනු ලැබේ).

6.3. නිර්මාණවල ගුණාත්මක බව ආරක්ෂා කර ගැනීම සඳහා මෙන් ම දුර්වල පිටපත් නිෂ්පාදනය කිරීම මගින් සිදු විය හැකි ද්‍රව්‍යමය හා මූල්‍යමය සම්පත් හානිය වලක්වා ඒවා වඩාත් සඵලදායී නිර්මාණාත්මක ප්‍රයත්නයන් කෙරෙහි යෙදවීමට අවකාශ සැලසීම සඳහා, 1 කාණ්ඩයට අයත් ශීර්ෂ සඳහා පිටපත් ඇගැයීම විනිශ්චය වටයක් ලෙස පැවැත්වෙන අතර එම ශීර්ෂවලට යම් පළාතකින් අයදුම් කර ඇති පිටපත්වලින් හොඳම 05 පමණක් පළාත් ඇගැයීම සඳහා තෝරා ගැනේ. එසේ තෝරා ගැනෙන පාසල් 05 අතරින් යම් පාසලක් පළාත් වටයට ඉදිරිපත් නො වේ නම් අනුක්‍රමයෙන් 06 වන 07 වන ස්ථානයන්ට අවස්ථාව හිමි වේ. එම නිසා තම පිටපත නිෂ්පාදනයේ දී ඉදිරිපත් කිරීමට අපේක්ෂිත කලාත්මක ප්‍රමිතිය සහ ස්වභාවය පිළිබඳ විස්තර සමීක්ෂණ මණ්ඩලයට තක්සේරු කළ හැකි පරිදි පිටපත සමග ලබා දිය යුතු ය (අතිශයින්ම නොසැලකිලිමත් ලෙස සකසා පිටපත් එවන විදුහල් උලෙළෙන් ඉවත් කෙරේ).

6.4 1 කාණ්ඩයේ 1.3.1 ඒකල භාෂණ නාට්‍ය පිළිබඳ ශීර්ෂය පළාත් උලෙළ සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙන්නේ, ඒ සඳහා පූර්ව කොන්දේසිය වන, 1 කාණ්ඩයේ අනෙක් නාට්‍ය නිෂ්පාදනය පළාත් උලෙළ සඳහා වේදිකා ගත කරන්නේ නම් පමණි. යම් හෙයකින් එම නාට්‍ය නිෂ්පාදනය ඉදිරිපත් නොකරන්නේ නම් උක්ත ශීර්ෂයට ද ඉදිරිපත් විය නොහැකි ය. මෙය සිසු සංඛ්‍යාව 300ට අඩු පාසල්වලට අදාළ නැත.

6.5 3 කාණ්ඩයේ භූමිකා රංගන, කතා පුවත් හා අභිරූපණ පළාත් උලෙළ සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙන්නේ, ඒ සඳහා පූර්ව කොන්දේසිය වන, 1 හා 2 කාණ්ඩයේ නිර්මාණ පළාත් උලෙළ සඳහා වේදිකා ගත කරන්නේ නම් පමණි.

6.6 යම් නාට්‍ය ශීර්ෂ සඳහා අයදුම් කර ඇති ස්වභාවය අනුව යම් ශීර්ෂයක් හෝ ශීර්ෂ කිහිපයක් සඳහා තදාසන්න පළාත් දෙකක හෝ කිහිපයක පළාත් ඇගැයීම්, එක් ස්ථානයක වේදිකාගත කර වෙන් වෙන් වශයෙන් පළාත් පාදකව ඇගැයීමට ලක් කිරීමට කටයුතු යෙදෙනු ඇත.

6.7 පළාත් උලෙළ අදාළ පළාත භාර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ එක්ව සංවිධානය කළ යුතු අතර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට සහය වීම පළාතේ සෞන්දර්ය හෝ නාට්‍ය හා රංග කලා විෂය භාර අධ්‍යක්ෂවරයාගේ හෝ අධ්‍යක්ෂවරියගේ වගකීම වේ.

6.8 පළාත් උලෙළට ඉදිරිපත් කළ සිසුන් ම එකී ශීර්ෂවලින් සමස්ත ලංකා මට්ටමට ද පෙනී සිටීම අනිවාර්ය වේ. මේ සම්බන්ධයෙන් නොවැලැක්විය හැකි යම් ගැටලුවක් පළාත් උලෙළ මට්ටමේ දී මතු වුවහොත්, මෙහි කොන්දේසි උල්ලංඝනය නො වන පරිදි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේත්, සමස්ත ලංකා මට්ටමේ දී මෙම අමාත්‍යාංශයේ ලේකම්ගේත් උපදේශකත්වය හා පූර්ව ලිඛිත අනුමැතිය මත පමණක් එම ගැටලුව නිරාකරණය කර ගත යුතු ය.

6.9 ජාතික වටය 2025 සැප්තැම්බර් 20 සහ 21 දෙදින පැවැත්වේ.

6.10 සෑම උලෙළ අවස්ථාවක දී ම සිසුන් ඉදිරිපත් කළ යුත්තේ උලෙළට ඉදිරිපත් වන පාසලේ විදුහල්පතිගේ අනුමැතිය මත පමණක් වන අතර ආනුෂංගික අංගවල ශිල්පීය අවශ්‍යතාවන් සඳහා වෙනත් පාසලකින් සිසුන් හෝ ගුරුවරුන් යොදවා ගැනීමේ දී ද අදාළ විදුහල්පතිවරුන්ගේ අන්‍යොන්‍ය එකඟතාව හා අනුමැතිය මත එය සිදුවිය යුතු ය.

6.11 ඒකල, යුගල හෝ සමූහ ශීර්ෂයකට සහභාගී වන යම් සිසුවකු, සිසුවියක හෝ එම අංගය පුහුණු කිරීමට දායක වූ ගුරු භවතෙකු අයත් පාසලක් පළාත් මට්ටමට පෙනී සිට සමස්ත ලංකා මට්ටමට සුදුසුකම් ලබා ඇති අවස්ථවක දී, සමස්ත ලංකා අවස්ථාව පැවැත්වීමට පෙර එම සිසුවාට, සිසුවියට හෝ ගුරුභවතාට වෙනත් පාසලකට ඇතුළත් වීමට හෝ ස්ථාන මාරු වීමට හෝ වෙනත් තනතුරකට පත් වීමට සිදු වූ විටෙක, මෙම වසර සඳහා පමණක් තමා මුලින් ම පළාත් මට්ටමට පෙනී සිටි පාසල නියෝජනය කිරීමට ඉඩ ලබා දිය යුතු වේ. එහි දී ඔහු හෝ ඇය තමන් පළාත් වටයට ඉදිරිපත්ව සමස්ත ලංකා වටයට සුදුසුකම් ලද පාසල නියෝජනය කරන්නෙක් ලෙස ජාතික වටය අවසන් වන තෙක් ම සැලකේ.

## 7. නාට්‍ය පෙළ හා අන්තර්ගතය

7.1 කවර මූලාශ්‍රයක් පදනම් කර ගැනුණ ද සියලු ම නාට්‍ය පෙළ රචනා ස්වතන්ත්‍ර නිර්මාණ විය යුතු ය (02 කාණ්ඩයේ ශීර්ෂ හැර).

7.2 මෙම උලෙළ සඳහා නිර්මාණය කරන සහ නිෂ්පාදනය කරන නාට්‍යවල තේමා, කතා වස්තූන්, ගී පද මාලා, දෙබස් සහ නාට්‍ය පෙළ ආදිය ජාති, ආගම්, කුල භේදවලට හා වෙනත් සමාජ විරෝධී අරමුණුවලට තුඩු නොදෙන එවැනි අදහස් ගම්‍ය නොවන ඒවා විය යුතු අතර, එවන් අදහස් ගම්‍ය වන පරිදි අර්ථකථනය නො කළ යුතු ද වේ. තව ද, තමන් අයත් වන හෝ නියෝජනය කරන ජාති, ආගම්, සංස්කෘතික හා දේශපාලනික මතිමතාන්තර හේතුකොටගෙන කිසියම් සමාජ කොට්ඨාසයක් අපහසුවට ලක් විය හැකි ආකාරයේ ඉදිරිපත් කිරීම්වලින් වැළකිය යුතු ය.

7.3 සියලු නිර්මාණයන් පාසල් සිසුනට උචිත, පාසල් පද්ධතියේ පිළිගත් වටිනාකම් හා නො ගැටෙන ඒවා විය යුතු අතර අවර ගණයේ භාෂා ව්‍යවහාරයන්ගෙන් තොර විය යුතු ය. 02 කාණ්ඩයේ ශීර්ෂයන්ට අදාළ පෙළ තෝරා ගැනීමේ දී ද, ඉහත කරුණ පිළිබඳව බෙහෙවින් සැලකිලිමත් විය යුතු වේ.

7.4 අන්තර්ගතය අතින් ඉහත කොන්දේසි හා අනුකූල නොවන නාට්‍ය පිටපත් පළමු වටයේ දී ම උලෙළින් ඉවත් කරනු ලැබේ.

7.5 1 කාණ්ඩයේ නාට්‍ය නිෂ්පාදනවල දී අදාළ පාසලේ ස්ථිර රාජ්‍ය සේවයේ නියුතු විදුහල්පති, ගුරුභවතකු හෝ වෙනත් කාර්ය මණ්ඩල සාමාජිකයකු, එසේත් නැතිනම් සිසුවෙකු හෝ සිසුවියක විසින් නාට්‍ය පිටපත රචනා කළ යුතු ය.

## 8. ඇගැයීම

8.1 පිටපත් වටය, පළාත් වටය සහ ජාතික වටය යන මට්ටම්වල නාට්‍ය ඇගැයීම සඳහා ඇගැයීම් මණ්ඩල, ශ්‍රී ලංකා කලා මණ්ඩලයෙහි රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය විසින් නිර්දේශිත, ජාතික මට්ටමේ නාට්‍ය හා රංග කලා විෂය විශේෂඥයින්ගෙන් හෝ අමාත්‍යාංශයීය විශේෂ අනුමැතිය සහිත විෂය විශේෂඥයන්ගෙන් සමන්විත ප්‍රවීණ සම්පත්දායක සංචිතයක් අතරින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පත් කෙරෙනු ඇත.

8.2 නාට්‍ය නිෂ්පාදනයක් ඇගැයීම යනු එක් නිර්මාණයක් ඇතුළත එකිනෙකට වෙනස් ක්ෂේත්‍රයන් 10ක් පමණ සුවිශේෂ වශයෙන් සැලකිල්ලට ගෙන ඇගැයීමට සිදුවන සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් මෙම උලෙළෙහි කිසිදු අවස්ථාවක දී ඇගැයීම් මණ්ඩල සහ ඇගැයීම් ක්‍රියාවලිය ගණිතමය/ සංඛ්‍යාත්මක සාධක මත පදනම් නොකෙරේ. ඇගැයීම් ක්ෂේත්‍ර පිළිබඳ අවශ්‍යතාවන් පාදකව, ජාතික වටයේ දී අවම වශයෙන් තුනත් උපරිම වශයෙන් හයත් අතර සංඛ්‍යාවකින් යුතුව ඇගැයීම් මණ්ඩල පත් කෙරෙන අතර, යම් ශීර්ෂයකට පත් කෙරෙන ඇගැයීම් මණ්ඩලය ඒ ඒ ඇගැයීම් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය එකගතාව මත ලබා දෙන ඇගැයීම පමණක්, අවසාන විනිශ්චය වශයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් භාර ගනු ලැබේ.

8.3 භූගෝලීය වශයෙන් මෙරට නාට්‍ය කලාවේ විෂම ව්‍යාප්තිය අනුව සහ රජය විසින් පවත්වන අන් සියලු ප්‍රධාන පෙළේ නාට්‍ය උලෙළවල සහ තරගවල අනුගමනය කෙරන ක්‍රියාවලිය අනුව, මෙම උලෙළෙහි ද පළාත් ඇගැයීම එක් පොදු ඇගැයීම් මණ්ඩලයක් මගින් සිදු කෙරේ. පළාත් ඇගැයීමට ලක් කෙරෙන 1, 2 හා 3 කාණ්ඩයේ සියලු නිර්මාණ ඒවායේ ගුණාත්මක මට්ටම අනුව පහත පරිදි ශ්‍රේණිගත කෙරේ. ජාතික අදියරට පෙර වඩාත් හොඳින් තම නිර්මාණය සකස් කර ගැනීම දිරි ගැන්වීම සඳහා ද මෙම වර්ගීකරණය සිදු කෙරේ (2 කාණ්ඩයේ පළාත් ඇගැයීමේ දී B සහ C ශ්‍රේණිවල නිර්මාණ ජාතික වටය සඳහා ඉදිරිපත් නො කෙරේ).

A ශ්‍රේණිය - ඉතා හොඳ නිෂ්පාදනයකි
B ශ්‍රේණිය - සාමාන්‍ය මට්ටමේ නිෂ්පාදනයකි
C ශ්‍රේණිය - දුර්වල නිෂ්පාදනයකි

8.4 පළාත් මට්ටමේ දී අංග රචනය, රංග වස්ත්‍රාභරණ සහ පසුතල නිර්මාණය යන ආනුෂංගික අංග ඇගැයීමට බඳුන් නො කෙරේ. ජාතික උලෙළට තේරී පත්වන හෝ ඉදිරිපත්වන නාට්‍ය අංග, එයට ඉදිරිපත් කිරීමේ දී නිර්මාණයට අදාළව ආනුෂංගික අංග භාවිත කළ යුතු ය.

8.5 මෙම උලෙළෙහි ඇතැම් ශීර්ෂයන් කිහිපයක් සඳහා අවශ්‍යනම් පටිගත කළ සංගීතය භාවිතයට හා ශබ්ද සංයෝජනයන් භාවිතයට ඉඩ ලබා දේ. එහෙත් ඒ සඳහා භාවිත කරන උපකරණවලට නාට්‍ය වේදිකාගත කෙරෙන ශාලාවල විදුලිය සැපයුමෙන් විදුලිය සැපයීම සහතික විය නොහැකි බැවින් අදාළ පාසල් විසින් යෝග්‍ය විකල්පයන් සොයා ගත යුතු ය.

8.6 නාට්‍යවල ගින්දර භාවිතය තහනම් වන අතර වේදිකා ආලෝක උපකරණ ගෙනැවිත් සවි කිරීම හෝ ධූම යන්ත්‍ර භාවිතය ද සපුරා තහනම් ය.

8.7 ජාතික වටයේ දී අදාළ නිර්මාණය වේදිකාගත කරන මධ්‍යස්ථානයට පිටතින් අංග රචනය සිදු කරගෙන පැමිණීම සපුරා තහනම් ය. එවැන්නක් සිදු කළ බව අනාවරණය වූ අවස්ථාවක දී අංග රචනය පිළිබඳ ඇගැයීමෙන් එම පාසල ඉවත් කෙරේ.

8.8 ජාතික වටයේ දී පසුතලයක් සවි කිරීම සහ සවි කර තිබූ පසුතලයක් ඉවත් කිරීම විනාඩි 10ක කාලයක් තුළ සිදු කළ යුතු ය. යම් ශීර්ෂයක ප්‍රථමයෙන් ඉදිරිපත් වන පාසල ද පසුතලය සවි කළ යුත්තේ ඇගැයීම් මණ්ඩලය අසුන් ගත් පසුව ඔවුන් ඉදිරිපිට දී ය. නැතහොත් අදාළ ඇගැයීම් මධ්‍යස්ථානයේ ප්‍රධාන සංවිධායක හෝ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ බලය ලත් නියෝජිතයකු ඉදිරිපිට දී ය.

8.9 මේ සෑම අවස්ථාවක දී ම ප්‍රධාන තිරය විවෘතව තබා ඇගැයීම් මණ්ඩලයට සහ අන් සැමට පෙනෙන පරිදි පසුතල සවි කිරීම සහ ඉවත් කිරීම සිදු කළ යුතු ය. දී ඇති කාල සීමාව තුළ ඉතා පහසුවෙන් සවි කළ හැකි අයුරින් ද, ආරක්ෂිතව නාට්‍යය තුළ භාවිත කළ හැකි අයුරින් ද අවසානයේ දී ඉතා කඩිනමින් ගලවා ඉවත් කළ හැකි අයුරින් ද පසුතලය සකස් කිරීමේ නිර්මාණාත්මක අභියෝගය අදාළ පාසල සතු වේ. අදාළ කාල සීමාව තුළ ඉවත් කර නොගන්නා සහ සවි කර නොගන්නා පසුතලයන්, පසුතල නිර්මාණ ඇගැයීමෙන් ඉවත් කරනු ලැබේ.

8.10 ඕනෑම උලෙළ අවස්ථාවකට ඉදිරිපත් වන නාට්‍ය ඇගැයීමේ දී, 3 කාණ්ඩයේ ශීර්ෂයන් හැර අන් සියලු ශීර්ෂයන්ට අයත් නාට්‍ය වේදිකා ගත කිරීම අනිවාර්යයෙන් ම සිදු කළ යුත්තේ, නාට්‍යයක් වේදිකා ගත කිරීම සඳහා යෝග්‍ය ප්‍රොසීනියම් වේදිකාවක් සහිත රංග ශාලාවක් තුළ පමණි.

8.11 ඕනෑම උලෙළ අවස්ථාවක දී වුව ද, එකකට වඩා වැඩි ඇගැයීම් මණ්ඩල සංඛ්‍යාවක නාට්‍ය ඇගැයීමේ කටයුතු සිදු කෙරෙන්නේ නම් එම ඇගැයීමේ මණ්ඩලවල පිහිටීම හා අදාළ මණ්ඩලවලට ඉදිරිපත් කෙරෙන ශීර්ෂයන් පිළිබඳව තොරතුරු ඇතුළත් කාල සටහනක් අදාළ පාසල් වෙත ලබා දීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතු ය.

8.12 කිසිදු ශීර්ෂයක් සඳහා සම ස්ථාන ලබා නො දේ.

8.13 කාල සටහනේ තමන්ට නියමිත කාලයට පෙර අදාළ ඇගැයීම් මණ්ඩලය පිහිටි පාසල වෙත පැමිණ සූදානම් වී, කාල සටහන අනුව සංවිධායක මණ්ඩලය විසින් තම නිර්මාණය වේදිකා ගත කිරීමට කැඳවා සිටින වේලාවට පෙර ලියාපදිංචි වීම අදාළ විදුහලේ වගකීමකි. කාල සටහනට අනුව තම පාසලට නිශ්චිත වශයෙන් ලබා දී ඇති වේලාවට අදාළ මණ්ඩලයට වාර්තා නොකරන ඕනෑම පාසලක් උලෙළට සහභාගී නොවන සේ සලකා එම අංශයට ඉදිරිපත්ව සිටින අනෙකුත් සහභාගී වන්නන් අපහසුවට පත් වීම වැලැක්වීමට කටයුතු කෙරෙනු ඇත.

8.14 ජාතික මට්ටමේ වටයේ දී, යම් ශීර්ෂයක් සඳහා යම් මණ්ඩලයකට ඉදිරිපත් වීම හේතුවෙන් එම විදුහලට වෙනත් මණ්ඩලයක වෙනත් ශීර්ෂයකට ඉදිරිපත් වීමෙහි යම් ප්‍රමාදයක් සිදු වේ නම්, ඒ බව කාල සටහන සමග ලබා දෙන දුරකථන අංකයට තම ශීර්ෂය, මණ්ඩල අංකය සහ පාසලේ නම සහ මුල් කාල සටහනෙන් නියමිත වූ වේලාව යන තොරතුරු සහිතව එම නිර්මාණය ඉදිරිපත් කරන එම පාසලේ ගුරුභවතාගේ නම සහ අත්සනින් යුතු ලේඛනයක් ඡායාරූපගත කර WhatsApp පණිවිඩයක් මගින් එම අවස්ථාවේ දී එවිය යුතුය.

8.15 මෙහි දී කාල සටහනේ යම් ශීර්ෂයක් ආරම්භ කර එහි අවසාන පාසලට නියම කර ඇති වේලාවෙන් පසුව හෝ, එම ශීර්ෂයේ පළමු පාසල ඉදිරිපත් කළ යම් වේලාවක සිට අනුපිළිවෙලින් එම ශීර්ෂයේ අවසාන පාසලට නියම විය යුතු වේලාවෙන් පසුව එම අවසාන පාසලේ වේලාවෙන් විනාඩි 30ක් ඉක්ම යන තෙක් ම එකී ශීර්ෂයට නියමිත යම් පාසලක් හෝ පාසල් නොදන්වා ඉදිරිපත් නොවූයේ නම්, එය/ඒවා සහභාගී නොවන්නේ යැයි සලකා අදාළ ශීර්ෂයේ ප්‍රතිඵල නිකුත් කළ හැකි ය.

8.16 කාල සටහනේ යම් ශීර්ෂයක පාසල් සියල්ල සඳහා ඉදිරිපත් විය යුතු පොදු වේලාවක් දක්වා ඇති විට, එම ලේඛනයෙහි පාසල් සටහන් කර ඇති අනුපිළිවෙල යනු ඉදිරිපත් විය යුතු අනුපිළිවෙල නො වේ. එම පාසල් සටහන්ව ඇති අනුපිළිවෙල නොතකා ඉදිරිපත් කිරීම සඳහා කැඳවීමට සංවිධායක මණ්ඩලයට බලය ඇත. තවද, පාසල්වලට වෙන වෙනම වේලාවන් ලබා දී ඇති විටෙක වුව ද, කාල කළමනාකරණයේ පහසුව වෙනුවෙන්, එම ශීර්ෂය ඇතුළත අනුපිළිවෙල නොතකා පාසල් කැඳවීමට ද සංවිධායක මණ්ඩලයට බලය ඇත.

8.17 මෙහි ශීර්ෂ යටතේ දක්වා ඇති කොන්දේසි අතර ඇති කාලයට, සහභාගී විය හැකි පුද්ගල සංඛ්‍යාවට සහ සහභාගී විය හැකි ශ්‍රේණි පරාසයන්ට අදාළ කොන්දේසීන්ගෙන් එකක් හෝ කිහිපයක් උලෙළෙහි ඕනෑම අවස්ථාවක දී උල්ලංඝනය වූ විටෙක එම වැරදි සඳහා දරුවන්ට වන්දි ගෙවීමට ඉඩ තබනු නොලැබේ. තම නිර්මාණය චක්‍රලේඛයට අනුකූලව ඉදිරිපත් කිරීම නිර්මාණයට දායක වන ගුරුභවතුන්ගේ සාමූහික වගකීමක් වන බැවින් අදාළ ශීර්ෂයෙන් එම පාසල නියෝජනය කළ සියලු ම ගුරු භවතුන්ගේ සහතික අයිතිය අවලංගු කරනු ලැබේ.

8.18 ජාතික වටය සඳහා සහභාගීවන පාසල්වලට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නේවාසික පහසුකම් ලබා නො දේ. නේවාසික පහසුකම් අවශ්‍ය පාසල්වලට පහසුවක් වශයෙන්. එම පහසුකම් ලබා ගත හැකි පාසල් පිළිබඳව තොරතුරු ලබා දීම පමණක් සිදු කෙරේ.

8.19 ජාතික හා පළාත් ප්‍රතිඵල, අදාළ වටය පවත්වන දිනයේදී ම ප්‍රකාශයට පත් කෙරේ.

## 9. විනය

9.1 එක් එක් අවස්ථාවට සහභාගී වීම සඳහා මධ්‍යස්ථානවලට කැඳවාගෙන එන සිසුන්ගේ ආරක්ෂාව, හැසිරීම, විනය හා භාරකාරත්වය පිළිබඳව විදුහල්පතිවරුන්ගේ සහ කණ්ඩායම් භාර ගුරුවරුන්ගේ විශේෂ අවධානය යොමු විය යුතු ය.

9.2 සිසුන්ගේ භාරකාරත්වය ගුරුමහතුන්ට ද, සිසුවියන්ගේ භාරකාරත්වය ගුරුමහත්මීන්ට ද පැවරේ.

9.3 කිසියම් අයථා සිදුවීමක් සිදුවුවහොත් ඒ සඳහා භාරකරුවන් වගකීමට බැඳේ. උලෙළ හා සම්බන්ධ කිසිදු අවස්ථාවක් සඳහා දෙමාපියන් සහභාගි කර නොගත යුතු ය.

9.4 මෙම උලෙළ සඳහා අයදුම් කර ඉදිරිපත් වන සියලු ම පාසල් හා අනෙකුත් අදාළ පාර්ශවකරුවන් උලෙළෙහි සෑම අවස්ථාවක දී ම මෙහි සඳහන් සියලු ම නීති රීති හා විධිවිධාන අනිවාර්යයෙන් ම පිළිපැදිමට බැඳී සිටින බවටත්, ඇගැයීම් මණ්ඩලයේ තීරණය කොන්දේසි විරහිතව පිළිගැනීමට බැඳී සිටින බවටත් සලකනු ලැබේ.

9.5 එබැවින් විනිශ්චය පිළිබඳ අභියාචනා ඉදිරිපත් නො කළ යුතු අතර එවන් අභියාචනා භාර නොගැනේ. විනිශ්චයෙන් පසුව තම නිර්මාණ පිළිබඳව හෝ විනිශ්චයන් පිළිබඳව ඇගැයීම් මණ්ඩලයෙන් කරුණු විමසිය නොහැකි ය.

9.6 මෙම උලෙළ ආශ්‍රිත මොනයම් හෝ කරුණකට අදාළව යම් වංචනික ක්‍රියාවක් සිදුව ඇතැයි උලෙළෙහි මොනයම් අවස්ථාවක දී හෝ උලෙළට පසුව හෝ අනාවරණය වුවහොත්, වගකිවයුතු ගුරු භවතුන්ට එරෙහිව විනය කාර්ය පරිපාටිය අනුව කටයුතු කොට, ඉදිරි කිසිදු අවස්ථාවක දි පාසල් පද්ධතිය නියෝජනය කරමින් කිසිදු උලෙළකට හෝ තරගයකට නාට්‍ය ඉදිරිපත් කිරීමේ අයිතිය අහෝසි කිරීම ඇතුළුව නිර්දේශිත අනෙකුත් විනය පියවරයන් ක්‍රියාත්මක කරනු ලැබේ.

9.7 සංවිධාන කටයුතුවලට බාධා පැමිණෙන අයුරින් හෝ වෙනත් නුසුදුසු ක්‍රියාවන් සිදුකරමින් හෝ හැසිරෙන ගුරුවරුන් හා සිසුන් වෙතොත් ඔවුන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කෙරෙනු ඇත.

9.8 මෙම උලෙළෙහි මොනම අවස්ථාවකදීවත් තම පාසලේ කටයුතු ආවරණය කිරීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අවසරයෙන් තොරව ජනමාධ්‍යවේදීන් හෝ ඡායාරූප ශිල්පීන් කැඳවාගෙන ඒම තහනම් ය.

9.9 අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජකාරියක් වන මෙම උලෙළෙහි සෑම අවස්ථාවක දී ම යම් පාසලක් ආශ්‍රිතව රාජකාරි ගනුදෙනු සිදු විය යුත්තේ අදාළ විදුහලේ විදුහල්පතිවරයාත්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාත් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයාත් අතර පමණි. තම පාසලේ වෙනත් පාර්ශවයන් එම රාජකාරි ගනුදෙනුවලට මැදිහත් නොකරගත යුතු අතර, අධ්‍යාපන පද්ධතියෙන් පරිබාහිර පාර්ශවයන් මෙම රාජකාරි කටයුතු සඳහා මැදිහත් කර නොගැනීමේ වගකීම ද අදාළ පාසලේ විදුහල්පති වෙත සෘජුවම පැවරේ.

9.10 ජාතික උලෙළ අදියරවල කාල සටහන් ලබා දීම, පැමිණ හෝ මාර්ගතව සහභාගී විය යුතු පූර්ව උපදෙස් රැස්වීමක දී සිදු කෙරෙනු ඇති බැවින් ඊට සහභාගී වීම අනිවාර්ය වේ. එම රැස්වීමේ දී ලබා දෙන 'විදුහල්පති විශේෂ ප්‍රකාශය' නම් ආකෘති පත්‍රය සම්පූර්ණ කර විදුහල්පතිගේ අත්සන සහිතව නාට්‍යය හෝ නිර්මාණය ඉදිරිපත් කරන අවස්ථාවේ දී ලබා නොදෙන පාසල්වලට නාට්‍ය වේදිකාගත කිරීමට ඉඩ ලබා නො දේ.

9.11 පාසලකට මෙම උපදෙස් පරිශීලනය කිරීමට නොහැකි වීම හෝ නොකිරීම නිදහසට කරුණක් නොවේ. ඉන් දරුවන්ට සිදුවිය හැකි හානි, නොසැලකිලිමත් බවේ හා වගකීම් විරහිත බවේ ප්‍රතිඵලයක් සේ සලකා අදාළ වගකිව යුතු පාර්ශවයන්ට විරුද්ධව පියවර ගනු ලැබේ.

## 10. අනන්‍යතාව තහවුරු කිරීම

10.1 අනන්‍යතාව තහවුරු කිරීමට අවශ්‍ය වූ විටෙක සෑම සහභාගීවන්නෙකුම පිළිගත් හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීමටල සෑම අවස්ථාවකදීම සූදානමින් සිටිය යුතු ය.

10.2 ජාතික හැඳුනුම්පත හෝ තැපැල් හැඳුනුම්පත නොමැති සිසුන්ගේ අත්සන සහිත ඡායාරූපය අදාළ විදුහල්පති විසින් අත්සන් කර අදාළ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ කලාපයේ සෞන්දර්ය හෝ වෙනත් විෂය අධ්‍යක්ෂවරයකු හො අධ්‍යක්ෂවරියක විසින් සහතික කර තිබිය යුතු ය.

10.3 අනන්‍යතාව තහවුරු කිරීමට අපොහොසත් වන්නන් උලෙළෙන් ඉවත් කෙරේ.

## 11. සම්මාන සහ සහතිකපත් පිරිනැමීම

11.1 පළාත් මට්ටමින් ජයග්‍රහණය ලබා ගන්නා සිසු දරුදැරියන්ට සහතික පත්‍ර පිරිනැමීමේ වැඩ පිළිවෙලක් පළාත් මට්ටමෙන් යොදා ගත යුතු ය. ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් සඳහා මෙම අමාත්‍යාංශය මගින් සහතික පත්‍ර පිරිනමනු ලැබේ.

11.2 ඒ ඒ ශීර්ෂයන්හි සුවිශේෂතාවන්ට අදාළ වන පරිදි සහ ඒ ඒ නිර්මාණයට ඇතුළත්ව ඇති පරිදි පහත අංගයන් සඳහා සහතික පත්‍ර පිරිනැමේ. තව ද පහත සඳහන් සහතික අතරින් කිසිවක් නොලබන සිසු සිසුවියන් සැමට සහභාගීත්ව සහතිකයක් පිරිනැමේ. සහතික පත් සැකසීම සඳහා අවශ්‍ය දත්ත ඇතුළත් කර එවිය යුතු Excel ගොනුවෙහි සබැදිය ජාතික මට්ටමේ කාල සටහන සමග මාර්ගතව ලබා දේ.

- හොඳම නිෂ්පාදනය 1, 2 හා 3 ස්ථාන (1 සහ 2 කාණ්ඩ - 11.4 බලන්න)
- හොඳම අධ්‍යක්ෂණය
- හොඳම නාට්‍ය පෙළ රචනය
- හොඳම භූමිකා රංගනය ඉදිරිපත් කළ ශිෂ්‍යයා 1, 2 සහ 3 ස්ථාන (1 සහ 2 කාණ්ඩ)
- හොඳම භූමිකා රංගනය ඉදිරිපත් කළ ශිෂ්‍යාව 1, 2 සහ 3 ස්ථාන (1 සහ 2 කාණ්ඩ)
- හොඳම අංග රචනය (1 සහ 2 කාණ්ඩ)

- හොඳම රංග වස්ත්‍රාභරණ නිර්මාණය (1 සහ 2 කාණ්ඩ)
- හොඳම වේදිකා පසුතල නිර්මාණය (1 සහ 2 කාණ්ඩ)
- හොඳම සංගීත නිර්මාණය/ හොඳම සංගීත - ශබ්ද සංයෝජනය (1 සහ 2 කාණ්ඩ)
- හොඳම රංග වින්‍යාසය (1 සහ 2 කාණ්ඩ)
- හොඳම වේදිකා පරිපාලනය (1 සහ 2 කාණ්ඩ)
- හොඳම භූමිකා රංගනය/ කතාන්දර කථනය/ අභිරූපණය 1,2,3 ස්ථාන (3 කාණ්ඩය සඳහා)
- ඇගයීම් මණ්ඩලයේ විශේෂ කුසලතා ඇගැයීම්

11.3 භූමිකා රංගනය ඉදිරිපත් කළ ශිෂ්‍යයා සහ ශිෂ්‍යාව තෝරා ගැනීමේ පදනම, නිරූපිත භූමිකාවේ ස්ත්‍රී/පුරුෂ භාවය නො ව, නළුවාගේ/නිළියගේ ස්ත්‍රී/පුරුෂ භාවය ය.

11.4 1 සහ 2 කාණ්ඩයේ නිර්මාණ අවසන් වටයට ඉදිරිපත් කරන අවස්ථාවේ දී නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබිඹු කෙරෙන ලේඛණ සමුච්චයක් (Production Portfolio) කුඩා පොත් පිංචක් ලෙස ඉදිරිපත් කිරීම අනිවාර්ය ය. ජාතික වටයේ හොඳම නිෂ්පාදනයට සම්මාන ලබා දීමේ දී මෙය අනිවාර්ය අවශ්‍යතාවකි. මුහුරත් අවස්ථාවේ පටන් අවසාන වටයට නිර්මාණය ඉදිරිපත් කිරීම දක්වා වන වැදගත් අවස්ථාවල ඡායාරූප වාර්තාවට ඇතුළත් විය යුතු වේ. (මෙහි දී එම නිෂ්පාදන ක්‍රියාවලිය කුඩා මුහුරත් උත්සවයකින් ආරම්භ කළ යුතු අතර, ඒ අවස්ථාවට විදුහල්පතිට සහ පාසලේ දෙමාපියන්, සුබපතන්නන් ආදී වෙනත් පර්ශවයන්ට අමතරව, කොට්ඨාස/ කලාප මට්ටමේ නිලධාරීන්ට ද ඇරයුම් කරන්නේ නම් වඩාත් සුදුසු ය). එමෙන්ම අංග රචනය, පසුතල නිර්මාණය සහ රංග වස්ත්‍රාභරණ නිර්මාණයට අදාළ පිරිසැලසුම් ද, අ.පො.ස උසස් පෙළ නාට්‍ය හා රංග කලාව ප්‍රායෝගික පරීක්ෂණයේ C-1, C-2 සහ C-3 ක්‍රියාකාරකම් සඳහා භාවිත කරන A 3 ප්‍රමාණයේ ආකෘති පත්‍ර මත පිරිසැලසුම් කර ඒවා ද ඇතුළත් කළ යුතු ය. මීට අමතරව වැදගත් වනු ඇතැයි තීරණය කරන අතිරේක ලේඛණ ද ඇතුළත් කළ හැකි ය. පුස්තකයෙහි සමස්ත කඩදාසි සංඛ්‍යාව 40 නොඉක්මවිය යුතු වේ. මෙම අවසථාවල වීඩියෝ කොටස් සහිත ඩීවීඩී තැටියක් ද ඇතුළත් කිරීම යෝග්‍ය ය. ඉතා අවම පිරිවැයකින් මෙම කටයුතු සිදු කළ යුතු බව ද අවධාරණය කෙරේ. ජාතික වටය පැවැත්වෙන දිනට පෙර මෙම නිෂ්පාදන කලබෙහි මෘදු පිටපතක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සපයන ඊ මේල් ලිපිනයට එවා තිබිය යුතු ය. ඉහළ ප්‍රමිතියේ පවතින නිෂ්පාදන කලබ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයීය වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කෙරේ.

11.5 සියලු කාණ්ඩවල නිර්මාණවල රංග වස්ත්‍ර හා පසුතල නිර්මාණ පිළිබද ක්ෂේත්‍ර සඳහා සම්මාන ප්‍රදානය කෙරෙන්නේ, අදාළ අංශයේ ප්‍රධාන වගකීම දරන ගුරුභවතාට පමණි. මීට ඉදිරිපත්ව ඇත්තේ සිසු දරුවන් නම් එම අංශයේ ප්‍රධාන වගකීම දරන සිසු දරුවන් දෙදෙනාට පමණි. ගුරුභවතුන් සහ සිසුන් දෙකොටසම සිටින්නේ නම් එක් ගුරුභවතෙක්ට සහ එක් සිසුවෙක්ට පමණි. රංග වස්ත්‍ර හා පසුතල නිර්මාණ හැර අනෙකුත් ක්ෂේත්‍ර සඳහා සම්මාන ලබා දිය යුත්තේ ඒ ඒ ක්ෂේත්‍රවලින් එක් අයෙකුට පමණි (අයදුම්පතෙහි යම් අංශයකින් නම් කිහිපයක් සඳහන් කෙරෙන අවස්ථාවක දී, ඒවායින් පළමුවෙන් සඳහන් කළ නම හෝ නම් දෙක පමණක් අදාළ ක්ෂේත්‍රයට අනුව සම්මාන සඳහා ඇතුළත් කර ගැනේ).

11.6 සමූහ නිර්මාණයක අධ්‍යක්ෂණය හෝ එම සමස්ත නිර්මාණය පුහුණු කර ඉදිරිපත් කිරීම සඳහා දායක විය හැක්කේ ගුරුභවතුන් උපරිම වශයෙන් දෙදෙනෙකුට පමණක් වන අතර, ඒකල නිර්මාණයක් අධ්‍යක්ෂණය හෝ පුහුණු කර ඉදිරිපත් කිරීම සඳහා දායක විය හැක්කේ එක් ගුරුභවතෙකුට පමණි.

මෙම චක්‍රලේඛයෙහි සඳහන් ඕනෑම කරුණක් ආශ්‍රිත අවසාන තීරණය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

## උලෙළ ශීර්ෂ

# 1 කාණ්ඩය – කෙටි නාට්‍ය නිෂ්පාදන

### 1.1 ස්වතන්ත්‍ර කෙටි නාට්‍ය

**නාට්‍යය රඟ දැක්වීමේ කාලය කෙටි වීමේ අරුතින් කෙටි නාට්‍ය ලෙස කිසි සේත්ම නොගැනෙන මෙම නිර්මාණාත්මක ප්‍රවේශයේ දී, ජීවිතය තුළින් උකහා ගත හැකි අනේකවිධ අත්දැකීම් හා නාට්‍යමය අවස්ථාවන්, අතිශයින් ප්‍රබල සහ සාරසංක්ෂිප්ත නාට්‍යමය අත්දැකීමක් ලෙස කලාත්මකව ප්‍රකාශ වීමක් අපේක්ෂා කෙරේ.**

- 6 සහ 13 ශ්‍රේණිවල සිසු සිසුවියන්ට පමණක් සහභාගී විය හැකි ය.
- කාලය උපරිමය විනාඩි 25 කි.
- ඒකීය රංග වින්‍යාසයක් පාදක කෙටි නාට්‍ය ආකෘතිය ඇතුළත පිහිටි නිර්මාණයක් විය යුතු ය (එනම් ළමා නාට්‍ය ආකෘතියේ නොවන නිර්මාණයක් විය යුතු ය).
- රංගනය, ආනුෂංගික අංග ඇතුළු සමස්ත නිෂ්පාදනයට සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව ඉහත ශ්‍රේණි පරාසයට අයත් සිසුන් 20ක් නොඉක්මවිය යුතු ය.
- සුදුසු ශෛලියක් නාට්‍ය නිර්මාණය සඳහා යොදා ගත හැකිය.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.

### 1.2 ළමා ප්‍රේක්ෂාගාරයක් සඳහා විශ්ව සාහිත්‍ය පාදක නාට්‍ය

**යෝජිත විශ්ව සාහිත්‍යකරුවකුගේ හෝ විශ්ව සාහිත්‍ය කෘතියක ළමුන්ට යෝග්‍ය කතාවක් පාදක කර ගනිමින්, ළමුන්ට මෙන්ම වැඩිහිටියන්ට ද එක සේ රස විඳිය හැකි සේ නිර්මිත නාට්‍ය නිෂ්පාදනයක් විය යුතු ය. ළමා නාට්‍ය වශයෙන් දැනට මෙරට ප්‍රචලිතව පවත්නා නාට්‍ය වර්ගයට වඩා සැම අතකින්ම නිර්මාණශීලී, අතිශයින්ම නාට්‍යානුසාරී සහ නැවුම් කලාත්මක මැදිහත්වීමක් මින් අපේක්ෂිත ය.**

- කාලය උපරිම විනාඩි 25 කි.
- 6 සහ 13 ශ්‍රේණිවල සිසු සිසුවියන්ට පමණක් සහභාගී විය හැකි ය.
- විදේශීය ජන කතාවක් ආශ්‍රිත නිර්මාණයක් විය යුතු ය.
- අයදුම්පත සමග මුල් කතාවේ පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර පොතක් නම් එහි ප්‍රකාශකයා හා ප්‍රකාශිත වර්ෂය පිළිබඳ තොරතුරු ද ඇතුළත් විය යුතු ය.
- රංගනය, ආනුෂංගික අංග ඇතුළු සමස්ත නිෂ්පාදනයට සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව ඉහත ශ්‍රේණි පරාසයට අයත් සිසුන් 25ක් නොඉක්මවිය යුතු ය.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.

### 1.3. ඒකල භාෂණ නාට්‍ය (Monologue Drama)

**1.3.1 ඒකල භාෂණ නාට්‍ය (රජයේ පාසල්, අනුමත පෞද්ගලික පාසල්, පිරිවෙන් විද්‍යායතන සඳහා)**
**1.3.2 ඒකල භාෂණ නාට්‍ය (ජාත්‍යන්තර සහ වෙනත් එවැනි පෞද්ගලික පාසල් සඳහා)**

එක රූපණ ශිල්පියෙක් පමණක් රංගනයෙහි යෙදෙමින් එක චරිතයක් පමණක් නිරූපණය විය යුතු නාට්‍ය ප්‍රකාරයකි (Monologue Drama). පසුබිම් සංගීතය ආදි ආනුෂංගික අංග ද භාවිත කළ හැකි ය.

- ගැහැණු/පිරිමි වශයෙන් වර්ග කිරීමක් නැත.
- ස්වතන්ත්‍ර නිර්මාණයක් විය යුතු අතර චරිතය ඉස්මතු විය යුතු ය.
- උත්තම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් සමන්විත ආඛ්‍යානයක් (First Person Narrative) විය යුතු ය.
- ශබ්ද හා සංගීත සංයෝජනයන් මෙන්ම අනෙකුත් ආනුෂංගික අංග භාවිතයට ද අවස්ථාව ඇත.
- 12 සහ 13 ශ්‍රේණිවල සිසු සිසුවියන්ට පමණක් සහභාගී විය හැකි ය.
- රංගනය, ආනුෂංගික අංග ඇතුළු සමස්ත නිෂ්පාදනයට සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව සිසු සිසුවියන් 08කි.
- උපරිම කාලය විනාඩි 15 කි. අවම කාලය විනාඩි 10කි.

# 2 කාණ්ඩය – නිර්දේශිත නාට්‍ය ජවනිකා

## 2.1 නූතන දෙස්/විදෙස් නාට්‍යකරුවන්ගේ නාට්‍ය ආශ්‍රිත නාට්‍යමය අවස්ථා නිරූපණය

**නම් කරන ලද දේශීය හෝ විදේශීය නාට්‍යකරුවන්ගේ නාට්‍ය ඇසුරෙන් තෝරාගත් නාට්‍යමය කොටස් නිරූපණය කිරීමකි (මෙම අංශයේ දී එක් වර්ෂයක දී යෝජිත දේශිය නාට්‍යකරුවන්ගේ නිර්මාණ යොදා ගැනෙන්නේ නම් අනෙක් වර්ෂයේ දී භාවිත වන්නේ යෝජිත විදේශීය නාට්‍යකරුවන්ගේ නිර්මාණ ය).**

- 2025 වර්ෂයට යෝජිත දේශීය නාට්‍යකරුවා: **විජිත ගුණරත්න**
- **දැති කියත, සුබ සාධක සහ බූරුවෙක් හා ඉණිමගක්** යන නාට්‍ය තුනෙන් එකකින් කොටසක් තෝරාගත යුතු ය.

## 2.2 ග්‍රීක-රෝම හා ශේක්ෂ්පියරියානු නාට්‍ය ආශ්‍රිත නාට්‍යමය අවස්ථා නිරූපණය

(මෙම අංශයේ දී එක් වර්ෂයක දී ග්‍රීක හෝ රෝම ප්‍රහසන භාවිත කෙරෙන්නේ නම් ඊළග වසරේ දී භාවිත වන්නේ ග්‍රීක හෝ රෝම ඛේදජනක නාට්‍ය වේ. ශේක්ෂ්පියරියානු නාට්‍ය ශීර්ෂයේ දී විලියම් ශේක්ෂ්පියර්ගේ ඛේදජනක, සුඛජනක හා ඓතිහාසික (Histories) නාට්‍ය වර්ගයන්ගෙන් වර්ෂයකට එකක් බැගින් භාවිතයට ගැනේ).

**2.2.1 ග්‍රීක ඛේදජනක නාට්‍ය -** (රජයේ පාසල්, අනුමත පෞද්ගලික පාසල්, පිරිවෙන් විද්‍යායතන සඳහා)
**2.2.2 ග්‍රීක ඛේදජනක නාට්‍ය -** ජාත්‍යන්තර සහ වෙනත් එවැනි පෞද්ගලික පාසල් සඳහා

- ඊඩිපස්, ඇන්ටිගනී යන නාට්‍යවලින් හැර ග්‍රීක ඛේදජනක නාට්‍ය ගණයේ අන් ඕනෑම නාට්‍යයකින් තෝරා ගත් කොටසක් නිරූපණය කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.
- නාට්‍යමය අවස්ථාවන් නිර්මාණය කිරීමේ දී, මෙම චක්‍රලේඛයෙහි අංක 7.2 හා 7.3 වගන්තිවල සඳහන් කරුණු පිළිබඳව ද සැලකිලිමත් විය යුතු ය.

**2.2.3 ශේක්ෂ්පියර් නාට්‍ය - Shakespearean Comedies**

- විලියම් ශේක්ෂ්පියර්ගේ **සුඛජනක** නාට්‍ය ගණයේ ඕනෑම නාට්‍යයකින් තෝරාගත් කොටසක් නිරූපණය කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.
- නාට්‍යමය අවස්ථාවන් නිර්මාණය කිරීමේ දී, මෙම චක්‍රලේඛයෙහි අංක 7.2 හා 7.3 වගන්තිවල සඳහන් කරුණු පිළිබඳව ද සැලකිලිමත් විය යුතු ය.

## 2.3 සංස්කෘත හා සරච්චන්ද්‍ර නාට්‍ය ආශ්‍රිත නාට්‍යමය අවස්ථා නිරූපණය

මෙම අංශයේ දී එක් වර්ෂයක දී සංස්කෘත නාට්‍ය යොදා ගැනනේනේ නම් අනෙක් වර්ෂයේ දී භාවිත වන්නේ එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍යකරුවාගේ නිර්මාණ වේ.

2.3 **සංස්කෘත නාට්‍ය**

- ශ්‍රී හර්ෂගේ රත්නාවලී නාටිකාවෙන් තෝරාගත් කොටසක් විය යුතු ය.

**ඉහත අංක 2.1, 2.2.1, 2.2.2, 2.2.3 සහ 2.3 දරන ශීර්ෂ සඳහා පොදු කොන්දේසි**

- 10-13 ශ්‍රේණිවල සිසුන්ට පමණක් සීමා විය යුතු ය.
- කාලය උපරිම විනාඩි 15ක් විය යුතු ය.
- රංගනය, ආනුෂංගික අංග ඇතුළත් සමස්ත නිෂ්පාදනයට සහභාගී විය හැකි උපරිම සිසු සංඛ්‍යාව 25කි.
- තෝරාගත් නාට්‍ය කොටසල මුල් පිටපතට අනුකූල විය යුතු අතර නාට්‍ය පෙළ වෙනස් කිරීමක් හෝ විකෘති කිරීමක් සිදු නො කළ යුතු ය (දෙන ලද සීමාවන් තුළ නාට්‍ය ජවනිකාව ඉදිරිපත් කිරීමේ පහසුව තකා සිදු කළ හැකි සහ නාට්‍යයේ මුඛ්‍ය අර්ථයට හානිකර නොවන ඉතා අවම සාධාරණ සහ සාධනීය වෙනස්කම්වලට ඉඩ ලබා දිය හැකි ය. එ කී වෙනස්කම්වල සාර්ථකත්වය හෝ සාධාරණත්වය පිළිබඳ අවසාන තීරණය ඇගැයීම් මණ්ඩලය සතු ය).

## 3 කාණ්ඩය – ඒකල නිරූපණ, භූමිකා රංගන සහ කතාන්දර කථනය

### 3.1 කතාන්දර කථනය

**3.1.1 ඒකල - ගැහැනු (6-9 ශ්‍රේණි)**
**3.1.2 ඒකල - පිරිමි (6-9 ශ්‍රේණි)**
**3.1.3 ඒකල - ගැහැනු (10-13 ශ්‍රේණි)**
**3.1.4 ඒකල - පිරිමි (10-13 ශ්‍රේණි)**

- 6-9 ශ්‍රේණි සඳහා ජනකතාවක් ද, 10-13 ශ්‍රේණි සඳහා සුදුසු සමකාලීන කතාවක් ද නාට්‍යානුසාරීව ඉදිරිපත් කළ යුතු ය.
- ප්‍රථම පුරුෂ දෘෂ්ටිකෝණයේ ආඛ්‍යානයක් (Third Person Narrative) විය යුතු ය.
- කාලය විනාඩි 03ත් 05ත් අතර විය යුතු ය.
- රංග භාණ්ඩ, රංග වස්ත්‍ර ආදිය භාවිත කිරීමට ඉඩ ඇති අතර ස්ථානීය වශයෙන් සපයා ගත හැකි මේසයක් පුටුවක් වැනි සරල සහ අත්‍යවශ්‍ය ම පසුතල පමණක් භාවිත කළ හැක.
- ඉදිරිපත් කරන්නාට පමණක් හැසිරවිය හැකි ආකාරයේ සංගීත/ශබ්ද සංයෝජනයන්ට ඉඩ ඇත.
- රූකඩ වුව ද භාවිත කිරීමට නිදහස තිබේ.

### 3.2 ඒකල නිරූපණ / ගැමි නාටක චරිත නිරූපණ / අභිරූපණ

ඒකල නිරූපණවල දී වාචික අභිනය කේන්ද්‍රීයව රංගන හැකියාව ඇගැයීම මූලික අරමුණ වන අතර අ.පො.ස උසස් පෙළ ප්‍රායෝගික පරීක්ෂණයට නිර්දේශිත භාෂණ කොටසක් ඉදිරිපත් කිරීම අපේක්ෂිතය. ගැමි නාටක චරිත නිරූපණ අංශයේ දී ශ්‍රී ලංකාවේ දේශීය ශාන්තිකර්ම ආශ්‍රිත නාට්‍යමය පෙළපාලියක් හෝ අන්තර් රංග අවස්ථාවක් හෝ සොකරි හා කෝලම් නාට්‍ය නිර්මාණ ආශ්‍රිත අවස්ථාවක් ආශ්‍රිත නිරූපණයක් අපේක්ෂිත ය.

**3.2.1 ඒකල නිරූපණය - ගැහැනු (10-13 ශ්‍රේණි)**
**3.2.2 ඒකල නිරූපණය - පිරිමි (10-13 ශ්‍රේණි)**

- කාලය විනාඩි 2ත් 5ත් අතර විය යුතු ය.
- දැනට අ.පො.ස උසස් පෙළ විභාගයේ නාට්‍ය හා රංග කලාව විෂය ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නිකුත් කර ඇති මූලාකෘතියේ A.1.1 සහ A.1.2 පෙළ ආශ්‍රිත භාෂණ රංගනයට නිර්දේශිත භාෂණ කොටස් දහසයෙන් එකක් පමණක් භාවිත කළ යුතු ය.
- මුල් කෘතියේ අර්ථයට හානි නො විය යුතු අතර එම පෙළ වෙනස් නොකළ යුතු ය.
- මුල් කෘතියේ අර්ථයට සිදු කෙරෙන සාධනීය අර්ථ විවරණයන් සඳහා නිදහස තිබේ.
- තෝරාගත් භාෂණ කොටස මතකයෙන් නිවැරදිව ඉදිරිපත් කළ යුතු වේ. ඒකල ශීර්ෂ ඇගැයීමේ දී රංගනයේ ගුණාත්මක බව ප්‍රමුඛ වශයෙන් සලකා බැලෙන අතර, ඉදිරිපත් කිරීමට ගතවන කාලය ද අතිරේක වශයෙන් සැලකිල්ලට බඳුන් කෙරේ.
- පෙළ මතක් කිරීමට ඉඩ නොලැබේ.
- නියම කර ඇති කාල සීමාවෙන් පසුව ඇගැයීම් මණ්ඩලයට, ඉදිරිපත් කිරීම නතර කළ හැකි ය.
- සියලු දරුවන් කළු පැහැති ටී ෂර්ටයකින් සහ දිග කලිසමකින් සැරසී ඉදිරිපත් විය යුතු අතර චරිතයට අදාළ රංග වස්ත්‍ර සහ අංග රචනයන් භාවිත නො කල යුතු ය.
- රංගනයේ දී භාවිත කිරීමට අත්‍යවශ්‍ය ම වන යම් රංග භාණ්ඩයක් හෝ වෙනත් සරල පසුතලමය ආධාරකයක් (උදා. පුටුවක්) හැර අන් කිසිවක් භාවිත නොකළ යුතු ය.
- පසුබිම් සංගීතය හෝ ශබ්ද භාවිත නොකළ යුතු ය.

**3.2.3 ඒකල ගැමි නාටක චරිත නිරූපණ - ගැහැනු (10-13 ශ්‍රේණි)**

**3.2.4 ඒකල ගැමි නාටක චරිත නිරූපණ - පිරිමි (10-13 ශ්‍රේණි)**

- ශ්‍රී ලංකාවේ දේශීය ශාන්තිකර්ම ආශ්‍රිත නාට්‍යමය පෙළපාළියක් හෝ සොකරි හා කෝලම් නාට්‍ය නිර්මාණ ආශ්‍රිත අවස්ථාවක් නිරූපණය කිරීම අපේක්ෂිත ය.
- මෙම වර්ෂය සඳහා දේශීය ශාන්තිකර්ම ආශ්‍රිත නාට්‍යමය පෙළපාළියක් පදනම් කරගත යුතු ය.
- කිසිදු පසුතලයක් අවශ්‍ය නැත.
- සංවාද සහිත නාට්‍යමය අවස්ථාවක් ඉදිරිපත් කළ යුතු අතර බෙර වාදන ශිල්පියෙක් (සිසුවෙක් හෝ සිසුවියක්) පමණක් සහාය කර ගත හැකි ය.
- වෙස් මුහුණු භාවිත නොකළ යුතු අතර සරල අංග රචනයකට ඉඩ ඇත.
- සාම්ප්‍රදායික ගමන්තාල, පද, ගායනා, වේෂභූෂණ සහිත විය යුතු ය.
- සහභාගී විය හැක්කේ 10-13 ශ්‍රේණිවල සිසුන්ට පමණි.
- කාලය උපරිම විනාඩි 08කි.

**3.2.5 ඒකල අභිරූපණ (12-13 ශ්‍රේණි) ගැහැනු**

- 12- 13 ශ්‍රේණිවල සිසුන්ට පමණක් සීමා විය යුතු ය.
- කාලය විනාඩි 03ත් 05ත් අතර විය යුතු ය.
- ස්වාධීන තේමාවක් යොදාගත හැකිය.
- සජීවී මෙන්ම පටිගත කරන ලද සංගීතය ද භාවිත කළ හැකි ය.
- අනෙකුත් ආනුෂංගික අංග නිර්මාණයට උචිතව යොදාගත හැකි ය.

**3.2.6 ඒකල අභිරූපණ (12-13 ශ්‍රේණි) පිරිමි**

- 12- 13 ශ්‍රේණිවල සිසුන්ට පමණක් සීමා විය යුතු ය.
- කාලය විනාඩි 03ත් 05ත් අතර විය යුතු ය.
- ස්වාධීන තේමාවක් යොදාගත හැකිය.
- සජීවී මෙන්ම පටිගත කරන ලද සංගීතය ද භාවිත කළ හැකි ය.
- අනෙකුත් ආනුෂංගික අංග නිර්මාණයට උචිතව යොදාගත හැකි ය.

**අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**මෙහෙයවන සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල - 2025**

## ලියාපදිංචිය සඳහා භාවිත කළ යුතු ආදර්ශ ආකෘතිය (A ආකෘතිය)

<table>
<tr><td>පාසලේ නම :-</td><td colspan="3"></td></tr>
<tr><td>පාසලේ ලිපිනය</td><td colspan="3"></td></tr>
<tr><td>පාසල අයත් පළාත</td><td></td><td>පාසල අයත් කලාපය</td><td></td></tr>
<tr><td>පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව</td><td></td><td>දුරකථන අංකය</td><td></td></tr>
</table>

කෙටි නාට්‍ය නිෂ්පාදන: (මේ සමග 3 කාණ්ඩයට පමණක් අයදුම් කළ හැකිය)

<table>
<tr><td>1<br>කාණ්ඩය</td><td>ශීර්ෂ අංකය</td><td>ශීර්ෂයේ නම</td><td colspan="2">ඉදිරිපත් කරන ගුරු භවතාගේ / අධ්‍යක්ෂගේ නම</td><td>අත්සන</td><td colspan="2">ජංගම දුරකථන අංකය</td></tr>
<tr><td rowspan="4">1.1<br>1.2<br>1.3.1<br>1.3.2</td><td rowspan="2"></td><td rowspan="2"></td><td colspan="2"></td><td></td><td colspan="2"></td></tr>
<tr><td>නාට්‍යයේ නම:</td><td colspan="2"></td><td>පුද්ගල සංඛ්‍යාව</td><td></td></tr>
<tr><td rowspan="2"></td><td rowspan="2"></td><td colspan="2"></td><td></td><td colspan="2"></td></tr>
<tr><td>නාට්‍යයේ නම:</td><td colspan="2"></td><td>පුද්ගල සංඛ්‍යාව</td><td></td></tr>
</table>

නිර්දේශිත නාට්‍ය ජවනිකා නිෂ්පාදන: (මේ සමග 3 කාණ්ඩයට පමණක් අයදුම් කළ හැකිය)

<table>
<tr><td>2<br>කාණ්ඩය</td><td>ශීර්ෂ අංකය</td><td>ශීර්ෂයේ නම</td><td colspan="2">ඉදිරිපත් කරන ගුරු භවතාගේ / අධ්‍යක්ෂගේ නම</td><td>අත්සන</td><td colspan="2">ජංගම දුරකථන අංකය</td></tr>
<tr><td rowspan="4">2.1<br>2.2.1<br>2.2.2<br>2.2.3<br>2.3</td><td rowspan="2"></td><td rowspan="2"></td><td colspan="2"></td><td></td><td colspan="2"></td></tr>
<tr><td>නාට්‍යයේ නම:</td><td colspan="2"></td><td>පුද්ගල සංඛ්‍යාව</td><td></td></tr>
<tr><td rowspan="2"></td><td rowspan="2"></td><td colspan="2"></td><td></td><td colspan="2"></td></tr>
<tr><td>නාට්‍යයේ නම:</td><td colspan="2"></td><td>පුද්ගල සංඛ්‍යාව</td><td></td></tr>
</table>

ඒකල රංගන: (1 හෝ 2 කාණ්ඩයට ඉදිරිපත් වන්නේ නම් පමණක් අයදුම් කළ හැකිය)

| 3 කාණ්ඩය | **ශීර්ෂ අංකය** | **ශීර්ෂයේ නම** | **ඉදිරිපත් කරන ගුරු භවතාගේ / අධ්‍යක්ෂගේ නම** | **පුද්ගල සංඛ්‍යාව** | **අත්සන** | **ජංගම දුරකථන අංකය** |
|---|---|---|---|---|---|---|
| 3.1.1 / 3.1.2<br>3.2.1 / 3.2.2 | | | | | | |
| 3.2.3 / 3.2.4<br>3.2.5 / 3.2.6 | | | | | | |

සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උලෙළ සඳහා නියමිත චක්‍රලේඛය මා ඇතුළු මීට දායක වන, ඉහත අත්සන් තබා ඇති ගුරු භවතුන් විසින් පෞද්ගලිකවම කියවා අවබෝධ කරගන්නා ලද බවත් ඒ අනුව අප විදුහල ඉහත ශීර්ෂයන්ට අයදුම් කිරීමට සුදුසුකම් ලබන බවත්, එම **චක්‍රලේඛයේ සඳහන් සියලු ම නීති රීති හා විධිවිධාන අනිවාර්යයෙන්ම පිළිපැදිමට බැඳී සිටින බවටත්, ඇගැයීම් මණ්ඩලයේ ඕනෑම තීරණයක් පිළිගැනීමට බැඳී සිටින බවටත් මෙයින් සහතික කරමි.** සෑම අවස්ථාවකදීම මාගේ විද්‍යාලයේ සිසු/සිසුවියන් සහ ගුරු භවතුන් විනයානුකූලව හැසිරවීමේ වගකීම පෞද්ගලිකවම භාරගන්නා බවත් සහතික වෙමි.

විදුහල්පතිගේ අත්සන දිනය:

නම: නිල මුද්‍රාව